**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය - 2020**

**------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------------**

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් වැය කර තිබුණු රු.6,562,369 ක්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා එම වටිනාකම නැවත නිවැරදි නොවන ආකාරයට බදු පෙර ලාභයට ද එකතු කර තිබුණි. මෙම නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ Cash Flow from Operating Activity යටතේ ඇති අගය වනුයේ රු.6,339,649 කි. Capital Investment Expensesලෙස රු.6,562,368.77 ක් ඉවත් කර Net Surplus අගය වන රු.6,339,649 ලාභ අලාභ ගිණුමෙහි සටහන් වී ඇත. නමුත් මෙම අගය Non Cash Movement ගණයෙහි ලා සැලකිය හැකි බැවින් නැවත ලාභයට එකතු කර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇති බව දන්වා සිටිමි. කෙසේ වුවද එම මුදල නැවතත් Investment Activities යටතේ Other Nature Capital Expenses ලෙස ඉවත් කර ඇති නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයට බලපෑමක් ඇති නොවන බව දන්වමි. | නිවැරදි අගය ගිණුම්වල දැක්වීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේදී මෝටර් රථ වාහන ගිණුමේ ශේෂය රු.1,480,624 ක් වැඩියෙන් දැක්වීම් නිරීක්ෂණය වූ ශේෂය, සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කර මූල්‍ය ප්‍රකාශනවල ගලපා | 2019 ජනවාරි 01 දිනට ආයතනයේ මොටර් රථ 09 ක පිරිවැය විගණන වාර්තාවේ රු.50,744,505 ලෙස පැවසුවද ආයතනයේ ශේෂපත්‍රය අනුව මොටර් රථ වල සත්‍ය පිරිවැය රු.522,225,130 වේ. ඒ අනුව රු.9,500,000 | -එම- |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේදී මෝටර් රථවල අගය ඉහත ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | පිරිවැය මෝටර් රථය 2019 වර්ෂය තුළදී රු.4,300,000 ට ප්‍රත්‍යාගණනය කල 2020 ජනවාරි 01 දිනට මෝටර් රථ ගිණුමේ ශේෂය රු.47,025,129 වන අතර එම අගය නිවැරදි වේ. | |
| (ඇ) | 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ජාතික විද්‍යා පදනමෙන් ලැබුණු රු.8,816,392 ක් ප්‍රදානයන් ලෙස දක්වා නොතිබුණි. ඉන් වියදම් කල රු.2,225,943 පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු ප්‍රදානයෙන් අඩුකර ඉතිරි මුදල වූ රු.6,590,449 ක් ගෙවිය යුතු ලෙස සාවද්‍යව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ජාතික විද්‍යා පදනම මඟින් මුදල් ප්‍රදානයන් ලබා දෙනුයේ ලිත් වර්ෂයක් සඳහා නොවේ. ඒ අනුව ජාතික විද්‍යා පදනමෙන් ලද මුල්ම මුදල් වටිනාකම ප්‍රදානයක් ලෙස අදාල මුදල ලද වර්ෂයේදී ගිණුම් වලට ඇතුළත් කර ඇත.<br>ඉන්පසුව මුදල් යොදවනු ලබන ආකාරයන් අනුව 2020 වර්ෂයේ ගැළපීම් සිදු කොට ශේෂ මුදල පමණක් ද්විත්ව සටහන් යොදා ගිණුම් වලට ගැළපීම් කර ඇත.ඒ අනුව රු. 6,590,449 වූ අවසන් ශේෂය ගෙවිය යුතු මුදලක් ලෙස දක්වා ඇත. | -එම- |
| (ඈ) | රජයේ ප්‍රදානවලින් මිලදී ගත් වත්කම් සඳහා වූ වර්ෂයේ ක්ෂය වියදමට අදාල විලම්භිත ආදායම ලෙස රු.1,328,811 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පිළිතුරු සපයා නැත. | නිවැරදි අගය දැක්වීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

--------------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 772 | 2019 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ අනුව අපහරණය කල යුතු ස්ථාවර වත්කම් අයිතම 333 ක් අපහරණය කර ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණි. | එකඟ වේ<br>2019 වර්ෂයට අදාල තොග සමීක්ෂණ කටයුතු 2020 මාර්තු මස වන විට සිදු කර අවසන් වූ අතර රට තුළ උද්ගතව පැවති Covide 19 වසංගතය හමුවේ කාර්යාල වසා දැමීම හා සංචරණ සීමා පැනවීම් තුලින් අදාල කාර්ය නිම කිරීමට නොහැකි විය.කෙසේවෙතත් 2020 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතුද අවසන් කර ඇති බැවින් විකිණීම සඳහා ඇති භාණ්ඩ ලැයිස්තුද සකස් කර ඇත.ඒ අනුව වෙන්දේසි කළ යුතු භාණ්ඩ වලට අදාල කටයුතු කඩිනමින් සිදු කරන බව දන්වමි. | සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ප්‍රකාරව වත්කම් ඉක්මනින් අපහරණය කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් මිලදී ගත් දිනය, පිරිවැය, එකතු කිරීම්, ඉවත් කිරීම්, ප්‍රත්‍යාගණන වටිනාකම සහ ක්ෂය කිරීම් දැක්වෙන පරිදි විධිමත් ලෙස ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. | එකඟ නොවේ<br>ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කටයුතු සිදු කර ඇත. ඒ අනුව වත්කම මිලදී ගත් දිනය, පිරිවැය, GRN අංකය, ඉවත් කිරීම් ආදී විස්තර ඇතුලත් ස්ථාවර වත්කම් ලේකණයක් පවත්වාගෙන යන බව දන්වමි. | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත් පරිදි පවත්වාගෙන යා යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.6,339,649 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.5,111,440 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,451,089 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට කොවිඩ් 19 වසංගතයේ බලපෑම නිසා පුහුණු වැඩසටහන් නිසිලෙස ක්‍රියාත්මක නොවීම, පර්යේෂණ වියදම් සහ මැණික් නිධි ගවේශණය සහ ඇගයීමේ ව්‍යාපෘතිය සඳහා ගිය වියදම් අඩුවීම සහ නඩත්තු වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| ආදායම් | 2020 | 2019 | ආදායම්/වියදම වැඩි අඩුවීමේ ප්‍රතිශතය | නිරීක්ෂණ |
|---|---|---|---|---|
| පුහුණු පාඨමාලා වෙනුවෙන් ලැබීම | 4,680,000 | - | 100 | පාසැල් ළමුන් පුහුණු කිරිම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබීම් |
| විවිධ ආදායම් | 1,042,833 | 1,690,025 | (38) | ශිෂ්‍යයන් ලියාපදිංචි කිරීමේ ආදායම අඩුවීම |
| ප්‍රාග්ධන ආදායම් භාණ්ඩාගාර - | 29,536,913 | 35,622,795 | (17) | ලැබූ ප්‍රතිපාදන අඩුවීම |
| **වියදම්** | | | | |
| පර්යේෂණ වියදම් සහ මැණික් නිධි ගවේෂණය හා ඇගයීමේ ව්‍යාපෘති වියදම් | 724,708 | 3,577,512 | (80) | කොවිඩ් වසංගතයේ බලපෑම නිසා 19 අදාල කාර්යයන් නිසි පරිදි කරගත නොහැකි වීම නිසා වියදම් අඩුවීම |
| පුහුණු වැඩසටහන් වියදම් | 530,092 | 1,995,303 | (74) | -එම- |
| පුහුණු වැඩසටහන් වැඩිදියුණු කිරීම් ප්‍රසිද්ධ කිරිම | 533,697 | 2,494,951 | (79) | -එම- |
| බාහිර දේශකයන්ගේ ගාස්තු | 1,031,800 | 2,565,195 | (60) | -එම- |

**2.3 අනුපාත විශ්ලේෂණය**

| | 2020 | 2019 | නිරීක්ෂණ |
|---|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 4.97:1 | 7.04:1 | ගෙවිය යුතු වියදම් රු.මිලියන 3.52 කින් වැඩිවීම |
| ක්ෂණික වත්කම් අනුපාතය | 4.44:1 | 5.68:1 | -එම- |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මැණික් වල අගය වැඩි කිරීම සඳහා නව තාක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳ අධ්‍යයනයක් හඳුන්වා දීම යටතේ ගෙවුඩ තාප පිරියම්කරණය සඳහා භාවිත කරන ලක්මිණි උදුන අළුත්වැඩියා කිරීම, පද්මරාග ලබා ගැනීම සඳහා රතු ගෙවුඩ සහ කහ සැපයර් හඳුනා ගැනීමේ පර්යේෂණ සිදුකිරීම අඳුරු ටුවර් මැල ප්‍රකීරණය සහ ඕපල් මත ග්‍රෑමා ප්‍රකීරණය පිළිබඳ අධ්‍යයනය සඳහා සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කර තිබුණද, මෙම පර්යේෂණ සිදුකර නොතිබුණි . | මෙම ව්‍යාපෘතිය දියත් කිරීම සඳහා ආයතන දෙක අතර අත්සන් තැබීම සඳහා අවබෝධතා ගිවිසුමක් කෙටුම්පත් කර එම ආයතනයට යොමු කර ඇත. මෙම කාලවකවානුව තුළ කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ආරම්භ වූ ව්‍යාපෘතියට බාධා ඇති වුවද එම ගිවිසුම අත්සන් තබා අදාළ පර්යේෂණ කටයුතු කඩිනමින් ඇරඹීමට කටයුතු යොදමින් පවතී.<br>කෝවිඩ් 19 වසංගත තත්ත්ව හේතුවෙන් හා ව්‍යාපෘති ප්‍රාග්ධන වියදම් අපේක්ෂිත කාලවලදී නොලැබීම මත එය අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | අදාල පර්යේෂණ කඩිනමින් ආරම්භ කල යුතුය. |
| (ආ) ආයතනයේ පර්යේෂණ අංශය විසින් 2017 - 2019 කාලය තුල සිදුකරන ලද නවෝත්පාදන 4 ක් වෙනුවෙන් ආයතනය රු.1,422,306 ක් වැයකර තිබුණද එම නවෝත්පාදන වෙළඳපලට හඳුන්වාදී ආදායම් ඉපයීමට හා එම නිෂ්පාදන අවශ්‍ය පාර්ශවයන්ට භාවිතය සඳහා ලබාදීමට වැඩපිළිවෙලක් සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතියට අදාළව සිදු කරනු ලැබූ නවෝත්පාදන සඳහා පේටන්ට් බලපත්‍ර අයදුම් කර ඇති අතර ජාතික බුද්ධිමය දේපල කාර්යාලය මඟින් එම පේටන්ට් බලපත්‍ර සමාලෝචනය කරනු ලබන අතර ඊට අදාළ සංශෝධන සිදු වෙමින් පවතී. මෙම නවෝත්පාදන බුද්ධිමය දේපලවන අතර පේටන්ට් බලපත්‍රයක් නොමැතිව ඒවා වෙළෙඳපොළට හඳුන්වා දී ආදායම් ඉපයීමට නොහැක. පේටන්ට් බලපත්‍රයක් ලැබීමෙන් අනතුරුව ජාතික විද්‍යා පදනම හරහා නියමිත ක්‍රමවේදයන්ට අනුකූලව එම නවෝත්පාදන වාණිජමය නිෂ්පාදනය සඳහා සුදුසු පාර්ශවයන්ට ලබා දීමට වැඩපිළිවෙළක් සකස් කිරීමටත් එමඟින් | නවෝත්පාදන වෙළඳපලට හඳුන්වාදී ආදායම් ඉපයීමට හැකි වැඩපිළිවෙල ක් ඉක්මනින් සකස් කිරීම කල යුතුය. |

ආදායම් ඉපයීමටත් බලාපොරොත්තු වේ. ඊට අමතරව නවෝත්පාදන පිළිබඳ තාක්ෂණික දැනුම අපගේ වැඩමුළු හා පාඨමාලා හරහා නිරතුරුවම මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ට ලබාදෙන අතර එමගින් ඔවුන් තුළ නවෝත්පාදන පිළිබඳ තාක්ෂණික දැනුම වර්ධනය කරනු ලබයි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) <u>ශ්‍රී ලංකාව තුළ මැණික් නිධි ගවේෂණය හා ඇගයීමේ ව්‍යාපෘතිය (2031 – 2008)</u><br>ආයතනයේ සිටින කාර්ය මණ්ඩලයට අමතරව සේවකයන් 22 ක් හා උපදේශකවරයෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට 2018 වර්ෂයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී ද ඒ සඳහා බඳවා නොගෙන උපාධිධාරී පුහුණුවන්නන් 5 දෙනෙකු බඳවාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. පළමු අදියර යටතේ දිස්ත්‍රික්ක 5 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 50 ක් තුල මැණික් නිධි ගවේෂණය කර සිතියම් නිර්මාණය කර අවසන් වාර්තා නිකුත් කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08 කට අදාල සිතියම් නිර්මාණය කර අවසන් වාර්තා නිකුත් කර තිබුණි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 38 කට අදාල ගවේෂණ කටයුතු ආරම්භ කර හෝ නොතිබුණි. ආරම්භ කර තිබූ තණමල්විල, කතරගම, කුරුවිට හා රත්නපුර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා මැණික් විභව සිතියම් සම්පූර්ණ කර නොතිබුණි. ව්‍යාපෘතිය තුලින් හඳුනාගෙන තිබූ මැණික් ඇතැයි සැලකෙන ප්‍රදේශ 05 ක නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට | දැනට ආයතනය සතුව ව්‍යාපෘති කටයුතු සඳහා යෙදවිය හැකි පර්යේෂණ නිලධාරීන් සිටිනුයේ තිදෙනෙතකු පමණි. මොවුන්ගෙන් දෙදෙනෙකු විසින් මෙහි සඳහන් ඇහැලියගොඩ, පැල්මඩුල්ල යන කොට්ඨාශයන්හි කටයුතු සිදුකර වාර්තා හා සිතියම් නිකුත් කර ඇත. රත්නපුර හා කුරුවිට කොට්ඨාසයන්හි කටයුතු 2020 වර්ෂය සඳහා සැලසුම් කර තිබුණද 2019 වර්ෂයේ ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම 2019 දෙවන කාර්තුව තෙක්ම ප්‍රමාද වීම නිසා ඇහැලියගොඩ හා පැල්මඩුල්ල කොට්ඨාසවල කටයුතු අරඹන ලද්දේ 2019 දෙවන කාර්තුවේ සිටය.<br>කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා දිර්ඝ කාලයක් රට වසා තැබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර ගවේෂණ සිදුකළ නොහැකි විය. නව කොට්ඨාසයන් දෙකෙහි කටයුතු නිසි කලට ආරම්භ කළ නොහැකි විය.<br>මෙම ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම වෙනුවෙන් ප්‍රතිපාදන සහ අනුමැතීන් අමාත්‍යංශය හරහා ඉල්ලීම් කර නැවත සිහි කැඳවීම්ද කර ඇති නමුත් මෙතෙක් එම ප්‍රතිපාදන සහ අනුමැතීන් ලැබී නොමැත.<br>ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමඟ ඒකාබද්ධව සිදු කිරීමට සැලසුම් කර ඇති නියමු ව්‍යාපෘතියෙන් පසුව මෙම ව්‍යාපෘතිය හරහා සැකසෙන මැණික් විභව සිතියම්වල සුදුසු ඉඩම් කැණීම් සඳහා වෙන්දේසි කිරීමට කටයුතු කිරීමටත් එම වෙන්දේසියෙන් පසු ලැබෙන ආදායමෙන් 25 % ක් මෙම ආයතනයට ලබා දීම පිළිබඳව එකඟතාවයට එළඹීමත් සිදුවනු ඇත. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව අනුමත කල ව්‍යාපෘති යෝජනාව ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත යොමුකර තිබුණද ක්‍රියාත්මක කර නොතිබුණි. තවද හඳුනාගන්නා ලද ඉඩම් වෙන්දේසි කිරීමෙන් ලැබෙන ආදායමෙන් සියයට 25 ක් ලබා ගැනීමට සහ මැණික් විභව සිතියම් අලෙවි කිරීම මගින් ලැබෙන ආදායමෙන් රු.මිලියන 176.15 ක් යොදවා ව්‍යාපෘතියේ දෙවන සහ තෙවන අදියර ක්‍රියාත්මක කිරීමට නියමිත විය. නමුත්, ආයතන 2 අතර වන සම්බන්ධීකරණයක් නොමැති වීම නිසා සිදුකල පර්යේෂණ වලින් මේ දක්වා ඵලදායිතාවක් ලැබී නොතිබුණි. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනත යටතේ අප ආයතනය බිහි කර ඇතත් ආයතන දෙක අතර මනා සම්බන්ධතාවයක් නොමැති වීම මත එම පර්යේෂණ ප්‍රතිඵල කර්මාන්තය වෙත සම්ප්‍රේෂණය වීමේ ගැටළුවක් පවතී. මේ පිළිබඳව අමාත්‍යාංශය ද මැදිහත්ව සාකච්ඡා පවත්වා ඇත.<br>ඒ අනුව කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන් අප පර්යේෂණ ප්‍රතිඵල ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හරහා කර්මාන්තය වෙත සම්ප්‍රේෂණය කර මෙම ව්‍යාපෘතිය සඳහා ඉදිරියේදී අවශ්‍ය වන රු.මි.176.15 ක දායකත්ව මුදල ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලෙස සපයා ගැනීමේ අපේක්ෂාවෙන් සිටිමු. | |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන කාර්යයන් සඳහා රු.මිලියන 8.62 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. ඉකුත් වර්ෂයේදී ද ප්‍රසම්පාදන කාර්යයන් සඳහා රු.මිලියන 22.6 ක් වෙන්කර තිබුණද එයද උපයෝජනය කර නොතිබුණි. | එකඟ නොවේ.<br>සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් අත්පත්කර ගැනීම සඳහා රුපියල් මිලියන 18.25 ක් නොව රුපියල් මිලියන 8.3 ක් පමණක් වෙන්කර තිබුණි. 2020 වර්ෂයෙහි සමස්ත ප්‍රාග්ධන අයවැයද රුපියල් මිලියන 19 ක් වේ. නමුත් රු.500,000 ට වැඩි ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය (Concurrence) ලබා ගත යුතු අතර රුපියල් මිලියන 19.00 සඳහා වියදම් අනුමැතිය ආයතනය වෙත නිකුත් කරන ලදී. එම Concurrence ලිපියට අනුව 2020 වර්ෂය සඳහා මිලදී ගැනීම සඳහා කිසිම ප්‍රතිපාදනයක් අනුමත නොවීම මත මිලදී ගැනීම් කටයුතු සිදු නොකරන ලදී. | වෙන්කරන ප්‍රතිපාදන නිසි කාල වකවානු තුල ලබා ගැනිමට සහ එම මුදල් උපයෝජනය කර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.4 නිශ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මැණික් පිළිස්සීම සඳහා 2013 වර්ෂයේදී ආයතනය විසින් රු.10,977,344 ක් වැයකර විදුලි උදුනක් මිලදී ගෙන වර්ෂ 06 ක කාලයක් නිශ්කාර්යව පැවතිණි. සමාලෝචිත වර්ෂයේදී මෙම උදුනේ සේවා සැපයීමේ කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් උත්සව වියදම් රු.559,462 ක් හා විදුලි උදුන ස්ථාපනය කිරීම, අමතර කොටස් සහ විදුලි පරිපථ වැඩි දියුණු කිරීම සඳහා තවත් රු.2,941,038 ක් වැයකර තිබුණු අතර විදුලි උදුන දීර්ඝ කාලයක් පාවිච්චි කර නොතිබීම හේතුවෙන් අධික අළුත්වැඩියා වියදම් දැරීමට සිදුවී තිබුණි. | මෙම විදුලි උදුන 2013 වර්ෂයේ මිල දී ගත්තද අපේක්ෂා කළ පරිදි එය කොළඹ ප්‍රධාන කාර්යාලයට රැගෙන ඒමට රත්නපුර ප්‍රදේශයේ නියෝජිතයන්ගෙන් ඇති වූ විරෝධතාවය මත උදුන ස්ථාපනය සඳහා සුදුසු ස්ථානයක් ලබා ගැනීම, උදුනට අවශ්‍ය විදුලි සැපයුම ලබා ගැනීම, විදුලි පරිපථ සකස් කිරීම, අදාළ විදුලි ආරක්ෂණ පද්ධතීන් සකස් කිරීම හා විදුලි ජනක යන්ත්‍රයක් ලබා ගැනීම ආදී කටයුතු සඳහා සැලකිය යුතු කාලයක් ගත වූ බැවින් උදුන අපේක්ෂිත පර්යේෂණ කටයුතු සඳහා යෙදවීම ප්‍රමාද විය. එනමුත් එම කටයුතු අවසන් කර 2020 වසරේ සිට අපේක්ෂිත පර්යේෂණ තාප පිරියම් කටයුතු සඳහා යොදවා ඇත. විදුලි උදුන ස්ථාපනය කර ඇති පරිශ්‍ර ප්‍රදේශයට පවතින අකුණු වැදීම් හරහා විදුලි පරිපථයේ හා උදුනේ උපාංගවලට බලපෑම් ඇති වී ඇත. මෙම අලුත්වැඩියාව අවසන් කර සුදුසු අකුණු ආරක්ෂණ පද්ධතියක් ද ස්ථාපනය කර මෙම උදුන මේ වන විට ක්‍රියාකාරිත්වයේ පවතින අතර මේ වන විට ක්‍රියාත්මක දැඩි සංවරණ සීමා පනවන අවස්ථාව වන තුරුම මෙම උදුන පර්යේෂණ තාප පිරියම් කටයුතු සඳහා යොදවා ඇත. | ආයතනය විසින් මේ සඳහා අධික වියදමක් දරා ඇති නිසා ඉක්මනින් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ආයතනය සතු ගත්මිල වටිනාකම රු.344,690 වූ ත්‍රිරෝද රථය අළුත්වැඩියා කර ධාවනයට නොයදවා වර්ෂ 03 කට වැඩි කාලයක සිට ආයතන පරිශයේ ගාල්කර පැවතුණි. දීර්ඝ කාලයක් ධාවනයේ නොපැවතීම හේතුවෙන් වාහනයේ සේවා කටයුතු වෙනුවෙන් අමතර වියදම් දැරීමට සිදු වී තිබුණි. | ත්‍රී රෝද රථය අලුත්වැඩියා කොට ආයතනයේ පරිහරණයට භාවිතා කිරීමට තීරණය වී ඇති අතර 2020 වර්ෂයේදී ආරම්භ වූ Covid 19 වසංගත තත්වය මත 2020 වර්ෂයේදී ආයතනය වෙත ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම මත එම කාර්යය ඉටු කර ගත නොහැකි විය. නමුත් මේ වන විට තාක්ෂණික කමිටු විසින් ඒ සඳහා තාක්ෂණික පිරිවිතර ලබා දී ඇති අතර අවශ්‍ය අලුත්වැඩියාවන් නිසි පරිදි ඉටු කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී. | අළුත්වැඩියා කර ඉක්මනින් ප්‍රයෝජනයට ගත යුතුය. |

## 3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජාතික විද්‍යා පදනමේ රු.10,481,088 ක මූල්‍යාධාර මත ක්‍රියාත්මක කර තිබූ අර්ධ මැණික්වල වර්ණය හා පැහැදිලි බව වැඩි කිරීමේ වඩා සඵලදායී හා කාර්යක්ෂම ක්‍රම හඳුන්වාදීමේ ව්‍යාපෘතිය සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසානයේ රු.2,479,445 ක් වැයකර නොතිබුණි. 2021 ජනවාරි 21 වන විට නිමකල යුතු ව්‍යාපෘතිය විගණන දින දක්වාම නිමකර නොතිබුණි. 2018 වර්ෂයේ මිලදී ගත යුතුව තිබූ ඇස්තමේන්තු වටිනාකම රු.1,130,000 ක් වූ Pressure Vessel යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේදී ද මිලදී ගෙන නොතිබුණි. 2018 හා 2019 වර්ෂවල ඉටුකල යුතු Oiling, Impregnation, Waxing, Diffusion, Glass Filling සහ Bleaching යන කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද සම්පූර්ණ කර නොතිබුණි. එසේම ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික සහකාරවරයෙකු හා කම්කරුවෙකු බඳවා ගත යුතු වුවද එම සේවකයන් බඳවා නොගෙන පර්යේෂණ ශිෂ්‍යයෙකු පමණක් බඳවාගෙන තිබුණි. තවද, රු.4,150,000 කට මිලදී ගැනීමට ඇස්තමේන්තුකර තිබූ තාක්ෂණ උපකරණ 03 ක් 2018 - 2020 කාල පරිච්ඡේදය තුලදී ආයතනය විසින් රු.9,101,341 කට මිලදීගෙන තිබුණි. ඇස්තමේන්තුව ඉක්මවා වැයකර තිබුණු රු.4,951,341 ක් ජාතික විද්‍යා පදනමෙන් ප්‍රතිපූරණය කර නොතිබුණි. | ව්‍යාපෘති යෝජනාව අනුව තාක්ෂණික උපකරණ 4ක් මිලදී ගැනීමට යෝජනා කර ඇති අතර ඒ සඳහා ඇස්තමේන්තු මුදලක් ඉදිරිපත් කර ඇත. එම උපකරණ මිලදී ගැනීමේ දී ජාතික විද්‍යා පදනමෙන් ලැබෙන ආධාර මුදල යොදවා ඉතිරි මුදල අප ආයතනය විසින් දැරීමට ද එම යෝජනාවේ සඳහන් කර ඇත. එම උපකරණ මිල දී ගත් පසු ඒවා අප ආයතනයේ වත්කම් යටතට ගැනෙන බැවින් එම උපකරණ මිලදී ගැනීමේ දී ජාතික විද්‍යා පදනමේ ආධාර මුදලට අමතරව අවශ්‍ය වූ රු.4,951,342 ක වියදම අප ආයතනයෙන් දරා ඇත. එම පදනම මත එම මුදල ජාතික විද්‍යා පදනමෙන් ප්‍රතිපූර්ණය කිරීමක් සිදු නොවන අතර එම උපකරණ ආයතනයේ අනෙකුත් පර්යේෂණ ව්‍යාපෘතීන් සඳහා ද වර්තමානයේ මෙන්ම ඉදිරියටත් භාවිතා කරනු ලබයි.<br><br>ව්‍යාපෘතිය සඳහා ලබා දුන් තාක්ෂණික සහකාර හා කම්කරු තනතුරු සඳහා සේවකයන් බඳවා ගත්ත ද ජාතික විද්‍යා පදනමින් ඒ සඳහා වෙන් කර තිබූ දීමනා පවතින ජීවන වියදම් සමඟ නොගැළපුන බැවින් එම සේවකයන් සේවය හැර යන ලදී.<br>Pressure Vessel උපකරණය මේ වන විට මිලදී ගෙන ඇති අතර ව්‍යාපෘතියේ අවසන් වාර්තාව ද ජාතික විද්‍යා පදනම වෙත ලබා දී ව්‍යාපෘතිය අවසන් කර ඇත.<br>මෙම ව්‍යාපෘති සඳහා ලබා දුන් තාක්ෂණික සහකාර සහ කම්කරු තනතුරු සඳහා බඳවා ගත්තද ජාතික විද්‍යා පදනමින් ඒ සඳහා වෙන් කර තිබූ දීමනා පවතින ජීවන වියදම් සමඟ නොගැලපෙන බැවින් එම සේවකයන් සේවය හැර යන ලදී. නැවත නැවතත් එම බඳවා ගැනීම් සිදු කළ ද එම හේතුව මතම කෙටි කලක් තුළ ඔවුන් සේවය හැර යන ලදී. | ජාතික විද්‍යා පදනම සමඟ ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015 වර්ෂයේ සිට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් ලබාදුන් රු.25,357,200 ක ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කෙරෙන දිළිදුකම පිටුදැකීමේ ව්‍යාපෘතිය යටතේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා තාක්ෂණ ශිල්පීන් 1000 ක් පුහුණු කිරීම සඳහා පවත්වා තිබුණු පාඨමාලා සඳහා 2015-2018 කාලය තුල 805 දෙනෙකු බඳවා ගෙන තිබුණි. ඉන් 255 දෙනෙකුම පුහුණුව අවසන් කර නොතිබුණි. පාඨමාලා සඳහා දැරූ වියදම වූ රු.3,577,395 ක් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. විදුලි උඳුන ස්ථාපනය කිරීම තුලින් ප්‍රදේශයේ ජනතාවගේ මැණික් තාපකරණ පහසුකම් හා සේවාවන් ලබා දීම මඟින් ආදායම් ඉපයීමට නොහැකිවීම හේතුවෙන් වියදම් ප්‍රතිපූර්ණය කිරීමට නොහැකි බව මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය දැනුම් දී තිබුණි. | විදුලි උඳුන සඳහා විදුලි පරිපථ සකස් කිරීමට වියදම් කළ මුදල ප්‍රතිපූරණය සඳහා එකඟතාවය පළ කර තිබූ පරිද්දෙන් විදුලි උඳුන ක්‍රියාකාරීත්වයට පැමිණි පසු දිගින් දිගටම ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත දැනුම් දෙන ලදී. නමුත් ඔවුන් ඒ සඳහා කටයුතු නොකළ අතර අවසන් වරට 2021 වර්ෂයේ සිදු කළ පර්යේෂණ කටයුතු අතරතුරද පැමිණ පරීක්ෂා කරන ලෙස දැනුම් දුන්නද ඊට යහපත් ප්‍රතිචාර නොලැබුණි.<br>2020 දෙසැම්බර් 31 දිනට දිළිදුකම පිටු දැකීමේ ව්‍යාපෘතිය යටතේ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ප්‍රතිපූර්ණය කරගත යුතු මුදල රු.3,577,395 වන මුදල නිවැරදි වේ.<br>ව්‍යාපෘතියේ සිසුන් හට පරිශීලනය සඳහා මිලදී ගත් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය සඳහා වැය කරන ලද මුදල රු. 884500 ක මුදල ප්‍රතිපූරණය කර ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු වාර්තා මේ වන විට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇත. එම රු.884,500 ක මුදල ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.<br>පුහුණුලාභීන් පාඨමාලා හැර යාම සාමාන්‍ය සියයට 20 ත් 30 ත් අතර දක්නට ලැබේ. මෙම පාඨමාලා හැරයාමේ ප්‍රවනතාවය පාලනය කිරීම සඳහා ආයතනය උපාය මාර්ගික වශයෙන් වැදගත් යයි හඳුනාගන්නා ලද පරිදි පුහුණු පාඨමාලා විෂය නිර්දේශ වර්තමාන වෙළඳපොළ අවශ්‍යතා පරිදි සංවර්ධනය කිරීම, සම්ප්‍රදායික ක්‍රම වලින් බැහැරව නවීන ඉගැන්වීමේ ක්‍රමවේද භාවිත කිරීම, නවීන අධ්‍යාපනික මෙවලම් හා උපකරණ භාවිතා කිරීමට කටයුතු කරනු ලබයි. | ආයතන දෙක අතර ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**3.6 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පර්යේෂණ හා පාඨමාලා පැවැත්වීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති ගොඩනැගිල්ලක මහල් 02 ක්, මසකට රු.1,000,000 කට 2017 වර්ෂයේ කුලියට ගෙන ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගොස් පැවතුණි. මෙම | එකඟ වේ.<br>මාලබේ කාර්යාලයේ සිට වෙනත් ස්ථානයකට ප්‍රධාන කාර්යාලය ගෙන යාම සඳහා එවකට සිටි සභාපතිවරයාගේ මැදිහත්වීම මත සිදු | පාඨමාලා සහ පර්යේෂණ පැවැත්වීමට ඉඩකඩ ඇති ස්ථානයක කාර්යාලය පවත්වා ගත යුතු අතර අවදානම් |

| | | |
|---|---|---|
| ගොඩනැඟිල්ලෙහි ඉරි තැලීම්, ජල කාන්දු වීම්, ප්‍රසාරණ සහ පැලුම් දක්නට තිබුණු අතර මෙම ගොඩනැගිල්ලෙහි කාර්යාලය පවත්වාගෙන යාමට සුදුසු නොවන බව ගොඩනැඟිල්ල සම්බන්ධව පරීක්ෂා කිරීමට පත්කළ තාක්ෂණ කමිටුවද වාර්තා කර තිබුණි. කුලියට ගත් ගොඩනැඟිල්ලට අනුකූලතා සහතිකය (COC) ලබා දී නොතිබුණ අතර ගොඩනැඟිල්ල ඉදිකිරීමේදී මහනගර සභාව ලබාදුන් නිර්දේශ උල්ලංඝනය වන ආකාරයට ගොඩනැඟිල්ල ඉදි කර තිබුණි. මේ අනුව නීත්‍යානුකූලව භාවිතයට ගත නොහැකි ගොඩනැඟිල්ලක් කුලියට ලබාගෙන තිබුණි. | කර ඇත. නමුත් එම වරද නිවැරදි කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී. ආයතනය වෙත නව ගොඩනැඟිල්ලක් ලබා ගැනීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම මඟින් ටෙන්ඩර්පත් කැඳවීමට නියමිත බව වැඩිදුරටත් දන්වමි. | සහිත ස්ථානයෙන් ඉක්මනින් ඉවත් වීමට කටයුතු කල යුතුය. |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 15 ක්, තෘතියික මට්ටමේ තනතුරු 06 ක්, ද්විතියික මට්ටමේ තනතුරු 34 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 කද ඇතුළුව මුළු තනතුරු 61 ක්ද පුරප්පාඩුව පැවතුණි. ඉන් අධ්‍යක්ෂ(පර්යේෂණ) තනතුර 2011 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින අතර ඒ සඳහා බඳවා ගැනීමට සමාලෝචිත වර්ෂයේද පියවරගෙන නොතිබුණි. එමෙන්ම ජ්‍යෙෂ්ඨ පර්යේෂණ (වර්ණ වැඩිදියුණු කිරීම), ජ්‍යෙෂ්ඨ පර්යේෂණ (නවෝත්පාදන), පර්යේෂණ නිලධාරීන් 08 සහ කථිකාචාර්යවරු 4 දෙනෙකුගේ පුරප්පාඩු පැවතියක් බඳවා ගැනීම් කර නොතිබුණි. පුහුණු අංශය සඳහා ස්ථිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීම වෙනුවට බාහිර කථිකාචාර්යවරුන්ගේ සහ ආයතනයේ නිලධාරීන්ගේ සේවය දිගින් දිගටම ලබාගෙන තිබුණි. | ආයතනයෙහි අනුමත සේවක සංඛ්‍යාව වන 136 න් 78 දෙනෙක් පමණක් සේවයේ නියුක්තව සිටින අතර පුරප්පාඩු සේවක සංඛ්‍යාව 61 ක් වේ. 2011 වසරේදී මෙම කාර්ය මණ්ඩල සංඛ්‍යාව අනුමත කරගෙන ඇති නමුත් සම්පූර්ණ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොමැත. බඳවාගෙන ඇති කාර්ය මණ්ඩලයේ සැලකිය යුතු ප්‍රමාණයක්ද විවිධ හේතු මත සේවයෙන් ඉවත්ව ගොස් ඇත.<br>විගණනය විසින් පෙන්වා දී ඇති ආකාරයට වර්ෂ 10 ක් ගත වන තුරුත් අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර සඳහා බඳවාගැනීමට ආයතනයට හැකි වී නැත. ඒ සඳහා විවිධ හේතූන් බලපා ඇත.<br><br>ආයතනයේ පුහුණු කාර්යය මණ්ඩලයේ පුහුණු නිලධාරි තනතුරු 10 ක් යටපත් කර නව තනතුරු10ක් ඇති කරන ලදී. එම නව තනතුරු වන්නේ කථිකාචාර්ය තනතුරු 4 ක් සහ ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරීන් 6 කි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් එම තනතුරු අනුමත කර ඇත්තේ 2018 වර්ෂයේ වන අතර අලුතෙන් ඇති කල තනතුරු කිහිපයක් මත ප්‍රතිපාදන සීමා සහිත වීම නිසා එම බඳවා ගැනීම එම වසරේදී සිදු කිරීමට නොහැකි විය.<br>පවත්නා ප්‍රතිපාදනවලට යටත්ව බඳවා ගැනීම් සිදු කිරීමට සිදුව ඇති බැවින් තවදුරටත් පුහුණු කාර්ය මණ්ඩලය බඳවාගැනීම් සිදු කිරීමට කල් ගතවනු ඇත.<br>ආයතනයට ස්ථිර කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වූ අතර ආයතනයේ පුහුණු කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා බාහිර පුහුණු නිලධාරීන්ගේ සහාය ලබා ගැනීමට ආයතනයට සිදු විය. නමුත් භාහිර පුහුණු කාර්ය මණ්ඩලය සඳහා සිදු කරනුවේ පැයකට රේටයක් වන බැවින් ස්ථිර කාර්ය මණ්ඩලයට වඩා අඩු පිරිවැයක් යටතේ මෙම සේවය ලබාගෙන ඇත. | ආයතනයේ දැනට පවතින පුරප්පාඩු සඳහා අවශ්‍යතාවය පරිදි සේවකයන් බඳවා ගත යුතු අතර විශේෂයෙන් පුහුණු අංශය සඳහා ස්ථිර කථිකාචාර්යව රුන් ඉක්මනින් බඳවාගත යුතුය. |

## 3.8 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ලියාපදිංචියේ සිට වසර 10 ක් ඉක්මවා නොමැති වුවත් ධාවන තත්ත්වයේ නොපවතින හා අළුත්වැඩියාව ආර්ථික වශයෙන් ඵලදායී නොවන වාහන අපහරණය කිරීමට අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ලියාපදිංචි කල දින සිට වර්ෂ 10 නොඉක්ම වූ රු.975,000 ක වටිනාකමට තක්සේරු කරන ලද වාහනයක් තක්සේරු මණ්ඩලය මගින් අළුත්වැඩියා කිරීමෙන් පසු භාවිත කල හැකි බවට නිර්දේශ කර තිබිණි. එසේ තිබියදී 2009-2016 කාලය තුල රු.982,844 ක අධික අළුත්වැඩියා වියදම් ඇති බව හේතු දක්වා තක්සේරු වටිනාකමද ඉක්මවා රු.1,612,000 කට 2020 දෙසැම්බර් 23 දින එම වාහනය අලෙවි කර තිබුණි. | මෙම වාහනය අවස්ථා ගණනාවකදී ක්‍රියා විරහිත වීම මත අලුත්වැඩියාවන් ගණනාවකට භාජනය කර ඇති අතර දිගින් දිගටම අලුත් වැඩියාවන් සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදු වීම සහ නැවත නැවත අලුත්වැඩියාවන් සිදු කර භාවිතා කිරීම ආර්ථිකමය වශයෙන් ඵලදායි නොවීම යන්න හේතු කොට ගෙන අපහරණය කල යුතු බවට අපහරණ කමිටුව නිර්දේශ කර ඇත .<br>තවද තක්සේරු කමිටුව විසින් මෙම රථය රු. 975,000 කට ඇස්තමේන්තු කර ඇත්තේ මෙහි ඇති අලුත්වැඩියාවන්ද සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව බව පෙනී යයි .<br>තක්සේරු කමිටුව විසින් අලුත්වැඩියාවන් කොට භාවිතයට ගැනීමට හැකි බව නිර්දේශ කොට තිබියදී මෙම වාහනය අපහරණය කල බව යන කරුණ පිළිගත නොහැක. මෙහිදී අලුත්වැඩියා කොට භාවිතා කිරීම ආර්ථිකමය වශයෙන් ඵලදායිද නැද්ද යන්න පිළිබඳව නොසලකා විගණනය විසින් පවසන අන්දමට අලුත්වැඩියාවන් සිදු කර භාවිතයට ගත්තේ නම් එය ආයතනයට විශාල පාඩුවක් වන්නට ඉඩ තිබුණි. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරික්ෂකවරයෙකු විසින් මෙම වාහනය අළුත්වැඩියා කිරිමෙන් පසු පාවිච්චි කල හැකි බවට 2019 අගෝස්තු 08 දින නිර්දේශ කර තිබියදි 2019 ජුලි 17 දින අපහරණය කිරිමේ කමිටු නිර්දේශයක් මත මෙම වාහනය අපහරණය කිරිම සම්බන්ධව නැවත පරික්ෂාවක් කල යුතුය. |